**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල - 2020**

-----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1. මතය ව්‍යාවනය**

------------------

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරියේ) 24(1) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හේතුවෙන් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2. ව්‍යාවනය මතය සඳහා පදනම**

---------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය ව්‍යාවනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමානවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ

**1.5. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කල යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.4 (සී) (ii) හි දායක මුදල්, මුදල් පදනම මත ගිණුම්ගත කරන බව දක්වා තිබුණි . ඒ අනුව වර්ෂය තුල ලැබී තිබූ අනිවාර්ය දායක මුදල් රු. 328,201,324ක් මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි. | කරුණ සම්බන්ධයෙන් එකඟ වී ඇත | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව වියදම් ගිණුම්ගත කළ යුතු වීම. |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවක අර්ථසාධක අරමුදලේ දායකයින්ගේ කේවල ගිණුම් නිසි පරිදි පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා අවසාන සාමාජික සංඛ්‍යාවන් තහවුරු කර ගැනීම සඳහා සාමාජික ලේඛනය විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු. 28,972,771,536ක්, ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය රු. 44,799,765ක් හා රජයේ දායක මුදල් ගිණුමේ ශේෂය රු ,44,820,450. ක් වූ ශේෂයන් දායකයන්ගේ හිමිකම අනුව වෙන්කර හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. | කේවල ගිණුම් පවත්වා ගැනීම මඟින් මෙම ශේෂයන් තහවුරු කර ගැනීමට හැකි අතර ඒ සඳහා අදාල ආයතන වෙත පද්ධතිය හරහා තොරතුරු යොමු කරන ලෙස අවධාරණය කර ඇත. එම දැනුවත් කිරීම් හා සිහිකැඳවීම් වලට අනුව මේ වන විට ආයතන 80-90 අතර ප්‍රමාණයක් පද්ධතිය හරහා දායක මුදල් යොමු කිරීමට කටයුතු කරමින් පවතී. ඉදිරියේ දී මෙම ප්‍රමාණය තවදුරටත් වර්ධනය කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින අතර මාර්ග ගත ක්‍රමය තුලින් ලැබීම් 8% හා 12% | දායකයින්ගේ කේවල ගිණුම් පිළිබඳ විධිමත් දත්ත පද්ධතියක් පවත්වා ගැනීම මඟින් ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගත යුතු වීම |

| | | |
|---|---|---|
| | දායක ගිණුම් අනුව වර්ග කර කේවල ශේෂ ඉදිරිපත් කිරිමට කටයුතු සැලසුම් කරමින් පවතී. | |
| (ආ) මාසික ගිණුම් සාරාංශ මගින් විවිධ රජයේ ආයතන විසින් අරමුදලේ ගිණුමට සිදු කරන ලද හර හා බැර කිරීම්වලට අදාළ හඳුනා නොගත් ශේෂ නිරවුල් කරන තෙක් ගැලපුම් ගිණුමක සටහන් කර තිබුණි. මේ අනුව 2020 දෙසැම්බර් 31දිනට හඳුනා නොගත් ගැලපුම් ගිණුමෙහි පවතින වසර ගණනාවක සිට එකතුවෙමින් එන ශේෂය රු. 29,811,314ක් විය. විස්තරාත්මක උපලේඛයක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ශේෂය පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | අරමුදල පවත්වා ගෙන යන උපලේඛනයේ වසර ගණනකට පෙර සිට ආරම්භක ශේෂය රු. 29,807,957 පෙන්නුම් කරන අතර එය අපගේ ගැලපුම් ගිණුමේ ශේෂය හා නොගැලපේ. මෙම ශේෂ නිරවුල් කර ඇති ද යන්න ආයතන වෙතින් විමසීම් දිගින් දිගටම කරන ලද අතර ඉදිරියේ දී කළමනාකරණ කමිටුව හරහා මෙම වැරදි හර කිරීම් ඉවත් කිරීමට සුදුසු පියවර ගැනීමට අපේක්ෂා කෙරේ. | වාර්ෂිකව ගැලපුම් ගිණුමේ ශේෂ, වෙන වෙනම අදාල ආයතන සමඟ සැසඳුම් කර නිවැරදි ගිණුම්වලට ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,627,899,989 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 6,520,628,550 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,107,271,439 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අයෝජන මත පොළී ආදායම් රු. 897,993,615 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අරමුදලේ සාමාජිකයන් විසින් ප්‍රතිලාභ ලබා ගැනිම සඳහා වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද මුළු අයදුම්පත්‍ර 5,188 ක් අතරින් අයදුම් පත්‍ර 987 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද ගෙවීම් කර නොතිබුණි. | 2020 වර්ෂයේ මාර්තු මස දී සහ 2020 ඔක්තෝබර් මස අවසානයේ COVID 19 වෛරස ව්‍යාප්තිය සමඟ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වසා තැබීමට සිදු වීම මත නිළධාරින් කැඳවීමට නොහැකි වීම හේතුවෙන් වසර අවසානයේ ගෙවීම් නොකරන ලද අයදුම්පත්‍ර සංඛ්‍යාව 987 විය. | අයදුම්පත් සඳහා නොපමාව ගෙවීමට කටයුතු කළ යුතු වීම. |